// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2372/05 – 2024 පෙබරවාරි මස 19 වැනි සඳුදා – 2024.02.19
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2022/27.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

බී.ජී. තුෂාර ඉන්දික මහතා, අංක 04, හගරංවෙල, නාකියාදෙනිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. වටවල ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී, 754/5, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.
2. වටවල ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී, ඔයිල් ෆාම් වත්ත, නාකියාදෙනිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති

1A – G 41456 – 14 (2024/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, මාඹුල්ගොඩ, ජයසිංහ පාර, අංක 79, "ඉෂාරා" හි ආචාර්ය ආරියරත්න හොරදුගොඩ ගමගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 පෙබරවාරි මස 7 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/03/2022/27.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

බී.ජී. තුෂාර ඉන්දික මහතා, අංක 04, හගරංවෙල, නාකියාදෙනිය.
සහ
*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. වටවල ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී, 754/5, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.
2. වටවල ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී, ඔයිල් ෆාම් වත්ත, නාකියාදෙනිය.

ඉහත සඳහන් පාර්ශ්වන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

"වටවල ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. ආයතනයේ නාකියාදෙනිය ඔයිල් ෆාම් වත්ත කර්මාන්ත ශාලාවේ සේවය කළ බී.ජී. තුෂාර ඉන්දික මහතාට ෆෝමන් තනතුර සඳහා උසස්වීම් සඳහා හිමිකමක් තිබේ ද එසේ හිමිකමක් තිබේ නම් එම තනතුර ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ.

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 02 - 0142

මගේ අංකය: IR/COM/04/2019/165.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ස්වාධීන මෝටර් රථ සේවක සමිතිය (බී.ඒ.පී. ගුණවර්ධන මයා වෙනුවෙන්) 12/01, දූවන පල්ලිය පාර, උතුරු පල්ලන්සේන, කොච්චිකඩේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො.200, කිරුළ පාර, කොළඹ 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලය, කල්මුණේ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,කොළඹ 06, පොල්හේන්ගොඩ, එඩ්මන්ටන් නිවාස, XB 10/3 හි නීතිඥ ඩී.ජී.කේ. කරුණාරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/04/2019/165.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ස්වාධීන මෝටර් රථ සේවක සමිතිය (බී.ඒ.පී. ගුණවර්ධන මයා වෙනුවෙන්) 12/01, දූවන පල්ලිය පාර, උතුරු පල්ලන්සේන, කොච්චිකඩේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො.200, කිරුළ පාර, කොළඹ 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලය, කල්මුණේ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''බී.ඒ.පී. ගුණවර්ධන මහතා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ත්‍රිකුණාමලය ඩිපෝවේ සේවය කරන අවස්ථාවේ දී ලබා දෙන ලද ස්ථාන මාරු වීම නිසා සේවයට වාර්තා කිරීමට නොහැකි වූ කාලයට (2018.10.09) දින සිට 2018.11.26 දින දක්වා) වැටුප් සඳහා හිමිකමක් තිබේ ද හිමිකමක් තිබේ නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 02 - 0143